**<u>සමෘද්ධි සංවර්ධන නිළධාරී සහෝදරයා / සහෝදරිය,</u>**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය 2013 අංක 1 දරණ පනතින් 2014 වර්ෂයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 08 ක කාලයක් ගතවී ඇත.නමුත් අද වන තුරු අපගේ ප්‍රධාන ප්‍රශ්ණ කිසිවක් විසදීමට පාලක පක්ෂයට නොහැකිවීම සම්බන්ධයෙන් එක් එක් වෘත්තීය සමිති වෙත ඇගිල්ල දිගු කිරීම වෙනුවට සිදුව ඇති වරද නිවැරදි කර ගනිමින් ප්‍රශ්ණ විසදා ගැනීම සදහා ගන්නාවූ උත්සහයට සක්‍රියව දායකවන ලෙසට සිදුකරණු ලබන ගෞරවණීය ආරාධනාවයි.

1. විවිධ හැලහැප්පීම් වලට බදුන්ව අවුල් ජාලාවක් බවට පත්ව ඇති දෙපාර්තමේන්තු අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය.
2. වසර 02 ට වැඩි කලක් කළමණාකරණසේවා දෙපාර්තමේන්තුවේ හමස් පෙට්ටියේ සිරව ඇති සේවා සංයුතියට අදාල කෙටුම්පත .
3. සමෘද්ධි සංවර්ධන නිළධාරීන් වෙත බලපා ඇති වැටුප් විෂමතාවය.
4. කාර්යාල නිළධාරීන් සදහා අවශ්‍ය විභාග කඩිනමින් පවත්වා ඔවුනට කාර්යාලගත නිළධාරීන්ට අදාල පත්වීම් ලිපි ලබාදීමට කටයුතු කිරීම.
5. සමෘද්ධි බැංකුවේ ක්ෂේත්‍ර කටයුතු සිදුකරණ ක්ෂේත්‍ර නිළධාරීයා මාසික දීමනා වලදී නොසලකා හැරීම.

**<u>සමෘද්ධි බැංකු / බැංකු සමිති හා කාර්යාල ගත සමෘද්ධි සංවර්ධන නිළධාරී සහෝදරයා / සහෝදරිය,</u>**

තම සේවා දිවියේ කාර්ය බහුලම හා දැඩි පීඩනයෙන් පෙලෙනම කාල වකවානුවක් ගතකරමින් සිටින බව අප හොදාකාරවම අපි දනිමු.අපද එම තත්වයම අත්විදිමින් සිටියි.කෙසේ වෙතත් අප ජීවිත කාලයේ වැඩි කොටසක් ගෙවාදැමූ මෙම ආයතනය තුල සුවදායී,ප්‍රීතිමත් වැඩ පරිසරයක් ගොඩනගාගැනීම අප විසින්ම සිදුකළයුතු කටයුත්තකි.ඒ සඳහා,

1. නීති උපදෙස් නොතකා සමෘද්ධි බැංකු / සමෘද්ධි බැංකුසමිති නිළධාරීන්ට නීත්‍යානුකූලව ලබා දියයුතු ද්විතිය පදනමින් සේවයේ යෙදවීමට අදාල පත්වීම් ලිපි නිකුත් නොකිරීම.
2. සමෘද්ධි බැංකු / සමෘද්ධි බැංකුසමිති සේවක පුරප්පාඩු ගැටළුවට මේ දක්වා විසදුම් නොමැතිවීම.
3. යල්පැනගිය ලේඛණ ඉවත්කොට ඉතා කඩිනමින් තාක්ෂණික මෙවලම් යොදාගනිමින් බැංකු කටයුතු සිදුකිරීම කඩිනම් කිරීම.
4. සමෘද්ධි බැංකු / සමෘද්ධි බැංකුසමිති නිළධාරීන් වෙත මාසික දීමනා හා දින වැටුප් වල පවතින දැඩි විෂමතාවය.

**<u>සමෘද්ධි බැංකුවේ ක්ෂේත්‍ර නිළධාරී සහෝදරයා / සහෝදරිය,</u>**

මෙම වැඩසටහනෙහි ප්‍රමුකතම පුරුකක් වශයෙන් කටයුතු කරණ ඔබ සමෘද්ධි බැංකුවට අදාල ක්ෂේත්‍ර කටයුතු මෙන්ම ඔබට පැවරෙණ විවිධ ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සිදුකරමින් හෙම්බත්ව සිටිනබව අප දනිමු.

1. ඔබට පැවරී ඇති දහසකුත් රාජකාරී මධ්‍යයේ වුවද සමෘද්ධි බැංකුවට දක්වන දායකත්වයට නිසි ඇගයීමක් මේ දක්වා සිදු නොවීම.
2. වාර්ෂික ලාභ විසර්ජනයේ දී සිදුව ඇති අසාධාරණය.
3. සමෘද්ධි බැංකුවට දරදිය අදින ඔබට බැංකුවෙන් කිසිදු ප්‍රතිලාභයක් මේ දක්වා නොලැබීම.

ඉහත ගැටළු පිළිබදව විග්‍රහයක් මෙන්ම ඒ සදහා විසදුම් පිළිබදව කතිකා කෙරෙන

**සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන**
**( බැංකු,මහ සංගම් කාර්යාල හා ක්ෂේත්‍ර )**
**නිළධාරී සංගමයේ**
**වාර්ෂික බස්නාහිර පලාත් සම්මේලනයට**
**සහෘද ඔබ සැමට කෙරෙන**
**ගෞරවණීය ආරාධනාවයි!**

**දිනය:- 2022.12.16**

**ස්ථානය:- කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයේ තිහාරිය මන්සංධියේ පිහිටි ලස්සන් උත්සව ශාලාව**

**වෙලාව:- පෙ:ව:10.00 ට**

**මෙම සම්මේලනයට සහභාගීවන සියළු දෙනාට හට රාජකාරී නිවාඩු ලබාගැනීමට අවශ්‍ය කටයුතු සියල්ල මේ වන විටත් අවස්ථාව සලසා**